සීතාවක ප්‍රාදේශීය සභාව
කොළඹ දිස්ත්‍රික්කය
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ උපකරණ විෂයයක වටිනාකම වූ රු.18,950 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජූනි මස 29 දින ලැබී තිබූ කොඩිකනු 389 ක වටිනාකම වූ රු.384,534 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ උසාවි දඩ අදායම ලෙස ගිණුම්ගත කර තිබූ ඇස්තමේන්තු ගත වටිනාකම රු.15,000,000 කට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු.11,440,961 ක් ලැබී තිබූ අතර ඊට අදාල උසාවි දඩ අදායම අධි වෙන් කිරීම වූ රු.3,559,039 ක වටිනාකම ගිණුම්ගත නොකිරීම නිසා සමුච්චිත අරමුදල් ගිණුම හා ලැබිය යුතු උසාවි දඩ අදායම් ගිණුම රු.3,559,039 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වාර්ෂික උසාවි දඩ අදායම රු.15,000,000 ක් ලෙස ගිණුම් ගත කිරීම සභාවේ ගිණුම් ප්‍රතිපත්තිය වී තිබුණද, සමාලෝචිත වර්ෂයේදී උසාවි දඩ අදායම රු.19,000,000 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා වර්ෂයේ උසාවි දඩ ආදායම හා ලැබිය යුතු උසාවි දඩ ආදායම් ගිණුම රු.4,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් මාසයට අදාල ගෙවිය යුතු රු.785,058ක එකතු කල අගය මත බදු මුදල ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී ගෙවන ලද එකතු කළ අගය මත බදු වටිනාකම වු රු.5,859,034 ක් විවිධ තැන්පත් ගිණුමෙහි සටහන් කර තිබුණි.

(උ) 2015 දෙසැම්බර් මසට අදාල ජාතිය ගොඩනැගීමේ බදු මුදල වු රු.74,502 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) 2015 දෙසැම්බර් 31 දිනට සභාව විසින් වැඩියෙන් දරණ ලද රු.998,250 ක් වු සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීම් ගිණුම් ගත කර නොතිබුණි.

(එ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2012 දෙසැම්බර් 06 වන දින සභාවට ප්‍රදානය කර තිබු බෝට්ටුවක්, බෝට්ටු එන්ජිමක් සහ ජීවිතාරක්ෂක කබා 05ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොළී වටිනාකම රු.15,109 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුල කපා හරින ලද වටිනාකම රු.6,500 ක් වු හිඟ සතිපොළ ගාස්තු සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ සතිපොළ ගාස්තු අදායමෙන් අඩුකර තිබුණි.

(ඕ) ඉකුත් වර්ෂයේ අවසාන දිනට නොගෙවන ලද දේශීය ණය හා සංවර්ධන අරමුදලේ දෙසැම්බර් මස ණය වාරිකය ණය හිමියන් ලෙස සටහන් නොකිරීම නිවැරදි කිරීම සඳහා ප්‍රවර්තන වර්ෂයේදී වැරදි ලෙස ජ'නල් සටහන් තැබීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ශේෂය රු.681,801 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳෙන පාලන ගිණුම්
-----------------------------

ගිණුම් විෂයන් 4 ක ගිණුම් ශේෂ අවසන් ගිණුම් අනුව ශේෂය හා ඒවාට අදාල උපයෝගී ලේඛණ අනුව ශේෂය සැසඳිමේදී රු.897,658 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 නිරවුල් නොකරන ලද ගිණුම්
------------------------------

වර්ෂ ගණනාවක සිට ගිණුම්වල පැවත එන එකතුව රු.2,780,398 ක්වු ගිණුම් ශේෂ 10 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
--------------------------------------

(අ) තොරතුරු ඉදිරිපත් නොකිරීම
-------------------------------
එකතුව රු.2,331,631 ක් වු ගිණුම් විෂයයන් 07 ක් සාක්ෂි නොමැති වීම හේතුවෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2015 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද වටිනාකම රු. 8,753,333 ක්වූ විගණන විමසුම් 09 ක් සඳහා 2016 මැයි 31 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.33,896,818 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.22,364,439ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

මහජන බැංකුව හංවැල්ල ශාඛාවේ අංක 229-1-001-7-3826543 දරණ ගිණුමට අදාලව මාස 06 ඉක්මවූ රු.6,110 ක චෙක්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 පරිදි කටයුතු කර නොතිබුණි.

## 3 ආදායම් පරිපාලනය

### 3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව ලේකම්වරයා විසින් ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ජනවාරි 01 දිනට හිඟ ශේෂය | බිල් කිරීම | තථ්‍ය අයකර ගැනීම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 6,533,272 | 10,239,591 | 10,881,061 | 5,891,802 |
| බලපත්‍ර ගාස්තු | - | 1,483,777 | 1,483,777 | - |
| වෙළඳ ස්ථාන කුලී | 548,632 | 4,496,449 | 4,089,617 | 955,464 |
| කර්මාන්ත හා ව්‍යාපාර බදු | - | 2,212,330 | 2,212,330 | - |
| මස් කඩ | 319,375 | 8,859,850 | 8,867,407 | 311,818 |

3.2 පරිසර බලපත්‍ර

---------------

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලේඛණයට අනුව ලියාපදිංචි වී ඇති ආයතන 15 ක පරිසර බලපත්‍ර වලට අදාල වලංගු කාලය වූ වසර 03 ඉකුත් වී තිබුණද, එම බලපත්‍ර යාවත්කාලීන කර නොතිබීම නිසා සභාවට රු.73,800 ක මුදලක් අහිමි වී තිබුණි.

3.3 ප්‍රචාරණ දැන්වීම් ආදායම

---------------------------

සභාව මගින් ඉදිකරන ලද මගී ආවරණයන් 06 හි මේ දක්වා කිසිදු දැන්වීමක් ප්‍රදර්ශණය නොකිරීම හේතුවෙන් සභාවේ අපේක්ෂිත ආදායම රු.460,000 ක් අහිමි වි තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(අ) සභාවට අයත් පාදුක්ක සතිපොළ සියළු පහසුකම් වලින් සමන්විත සතිපොළක් ලෙස සංවර්ධනය කිරීම සඳහා 2014 මැයි 24 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගෙන තිබූ අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සතිපොළ ආදායම් එක්රැස් කිරීම සිදු කරමින් පැවතුනි. නමුත් දෛනිකව කසළ ඉවත් කර පොළ පිරිසිදු කිරීම සඳහා පසුගිය මාස 14 වෙනුවෙන් සභාව රු.1,715,774 ක මුදලක් වැයකර තිබූ අතර, කසළ එකතු කිරීම සහ ගල් ඉවත් කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල් ගෙවීමද නාගරික සංවර්ධන අධිකාරිය විසින් පැහැර හැර තිබුණි.

ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වෙන් කිරීම මත කොළඹ දිස්ත්‍රික් ලේකම් මගින් රු.15,000,000 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද සුදුවැල්ල ආදාහනාගාරය විවෘත කිරීමට පියවර ගෙන නොතිබුණි.

ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ පාදුක්ක පැරණි වෙළඳපොළ පිටුපස තාර දමා රථගාලක් ලෙසට ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.536,742 ක වියදමක් සභාව විසින් දරා තිබුණු අතර ඒ තුලින් අපේක්ෂිත කිසිදු ආදායමක් මේ වනතෙක් අයකර ගෙන නොතිබුණි.

ඈ) වටිනාකම රු.850,000 ක් වූ භාවිතයේ නොමැති ට්‍රැක්ටරය සහ වටිනාකම සඳහන් කර නොමැති අත් ට්‍රැක්ටරය සභා භූමියේ දිරාපත් වෙමින් පැවතිණි.

ඉ) සභාව විසින් බද්දට දී ඇති කඩ කාමර, පොදු ස්ථාන සහ හංවැල්ල නව සතිපොල ඉදිකිරීමේ කර්මාන්තයේ විදුලි බිල්පත් අදාළ බදුකරුවන්ගෙන් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර නොගෙන සභා අරමුදලින් එකතුව රු.100,071 ක් වූ විදුලි බිල්පත් ගෙවා තිබුණි.

ඊ) 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂවල එකතුව රු.19,083,366 ක් වූ අතර එම ශේෂය තුල අයකර ගැනිමට නොහැකි 1992 වර්ෂයට පෙර සිට පැවත එන රු.20,861ක මුදලක් ඇතුලත් වි තිබුණි.

උ) රු.2,478,204 ක පිරිවැයක් දරා සමාලෝචිත වර්ෂය තුල නව මගී ආවරණ 06 ක් ඉදිකර තිබූ අතර ඒ සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය ප්‍රකාරව ඉදිකිරීම සිදුකළ ආයතනය සමඟ ගිවිසුමක් ඇතිකර ගෙන නොතිබුණි.

ඌ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (උ) වගන්තියට පටහැනිව විථි රේඛා සහතික තැන්පත් මුදල්,ඔප්පු සාරාංශ තැන්පත් (ATD) හා ගලී බවුසර් සේවාව සඳහා ලබා ගත් රු. 26,560 ක් වූ ආදායම සේවකයින් අතරේ බෙදාහැර තිබුණි.

එ) සභාවේ වසර 02 කට පෙර සිට පැවත එන රු.5,567,738 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යාන්තර විගණනය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) කොන්ත්‍රාත් පාලනය

(ඊ) වත්කම් කළමනාකරණය